VERITÉ RESEARCH
Strategic Analysis for Asia

# හදිසි මහජන අවශ්‍යතා උදෙසා නිසි කාර්යය පටිපාටිය සහ සූදානම

## කොවිඩ් -19 වසංගතයෙන් ශ්‍රී ලංකාවට උගත හැකි පාඩම්

ජුනි 2021

# හදිසි මහජන අවශ්‍යතා උදෙසා නිසි කාර්යය පටිපාටිය සහ සූදානම

## කොවිඩ් -19 වසංගතයෙන් ශ්‍රී ලංකාවට උගත හැකි පාඩම්

2021 ජුනි

වෙරිටේ රිසර්ච් ආයතනයේ නීති පර්යේෂණ කණ්ඩායම මෙම වාර්තාව සකස් කරන ලදී.

සැලසුම සහ පිරිසැලසුම දිනුක් සේනාපතිරත්න විසිනි.

වෙරිටේ රිසර්ච් ආයතනය ආසියානු කලාපයේ සාකච්ඡා හා ප්‍රතිපත්ති සම්පාදනය සඳහා තොරතුරු හා විශ්ලේෂණයන් සැපයීමේ ප්‍රමුඛයා බවට පත් වීමට අපේක්ෂා කරන අතරම කලාපයේ සමාජ සංවර්ධනය සඳහා සංවාද හා අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම ද සිදු කරයි. මෙම ආයතනය ආර්ථික විද්‍යාව, සමාජ විද්‍යාව, දේශපාලනය, නීතිය සහ මාධ්‍ය යන ක්ෂේත්‍රවල පර්යේෂණ හා සංවාද සඳහා ක්‍රියාකාරීව දායක වන අතර දත්ත රැස් කිරීම, තොරතුරු සත්‍යාපනය, උපාය මාර්ග සංවර්ධනය සහ තීරණ විශ්ලේෂණය යන අංශවල සේවාවන් සපයයි.

විද්‍යුත් තැපෑලෙන් අදහස් යොමු කිරීමට: publications@veriteresearch.org

ප්‍රකාශන හිමිකම් [සීමා සහිත වෙරිටේ රිසර්ච් පුද්ගලික සමාගම 2021]

සියලුම හිමිකම් ඇවිරිණි.

ISBN: 978-624-5514-10-6

වෙනත් පර්යේෂණ වාර්තා පහත සබැඳියෙන් බාගත කළ හැකිය:
https://www.veriteresearch.org/publication_type/research-briefs/

ඔබගේ අදහස් විද්‍යුත් තැපෑල මාර්ගයෙන් යොමු කරන්න: publications@veriteresearch.org

# අන්තර්ගතය


1. හැඳින්වීම ........ 4

2. නීතිය: ශ්‍රී ලංකාවේ නිසි කාර්යය පටිපාටියේ විෂය පථය ........ 5

3. සංදර්භය සහ බලපෑම:නැඟීම සහ අගුළු දැමීම ........ 7

3.1 රැලි තුනක් සහ අගුළු දැමීමක් ........ 7

3.2 නීතිමය කටයුතුවල දී පුද්ගල පෙනීසිටීම් අත්හිටුවීම ........ 8

4. ප්‍රතිචාරය: ප්‍රමාදය සහ උදාසීන බව ........ 9

4.1 ඉහළ අධිකරණවල ප්‍රතිචාර ........ 9

4.2 මුල් අවස්ථා අධිකරණ සහ අධිකරණමය විනිශ්චය සභාවල ප්‍රතිචාර ........ 10

5. ගම්‍යමානවන කරුණු: නිසි කාර්යය පටිපාටියට ඇති බලපෑම් ........ 11

5.1 සාධාරණ නඩු විභාගයකට ඇති අයිතිය: ප්‍රමාදයන්ගෙන් බාධා පැමිණීම සහ මාර්ගෝපදේශ මගින් අනාරක්ෂිත වීම ........ 11

5.2 නෛතික නියෝජනය සහ නීතිමය සහාය සඳහා ප්‍රවේශය ........ 17

6. සංසන්දනාත්මක විශ්ලේෂණය: කොවිඩ්-19 තුල නිසි කාර්යය පටිපාටිය උල්ලංඝනයන් අවම කිරීම සඳහා ඉන්දියාවේ සහ සිංගප්පූරුවේ අනුගමනය කරන ලද පියවර ........ 19

6.1 ඉන්දියාව ........ 19

6.2 සිංගප්පූරුව ........ 20

7. අනාගතය සඳහා පාඩම් ........ 22

පරිච්ඡේදාන්ත සටහන් ........ 24

# 1
# හැඳින්වීම

"නිසි කාර්යය පටිපාටිය" යනු නීතිමය සංකල්පයක් වන අතර එය යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට මුහුන දී සිටින සෑම පුද්ගලයෙකුටම අනිවාර්යයෙන් ම හිමිවන නිශ්චිත අයිතිවාසිකම්, වරප්‍රසාද සහ මුක්තීන්ගෙන් සමන්විත වේ. යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය තුළ පවතින බල අසමතුලිතතාවයන්ගෙන් හා ගතිකතාවයන්ගෙන් පුද්ගලයන් ආරක්ෂා කිරීමට නිසි කාර්යය පටිපාටිය තුළින් සේවය සැලසෙන අතර එය පදනම් වී ඇත්තේ නීතියෙහි සමාන රැකවරණය සහ 'සාධාරණත්වය' වැනි මූලික නීති මූලධර්ම මත ය.[1] සාම්ප්‍රදායිකව, නිසි කාර්යය පටිපාටිය යන්නට අත් අඩංගුවට ගැනීමට හේතු දැන ගැනීමේ අයිතිය, අපක්ෂපාතී විනිසුරුවරයෙකු හෝ ජූරි සභාවක් ඉදිරියේ සාධාරණ නඩු විභාගයක් සඳහා ඇති අයිතිය සහ නීතිමය නියෝජනය සඳහා ඇති අයිතිය වැනි අයිතිවාසිකම් සහ නිදහස අන්තර්ගත වේ.[2] යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට මුහුණ දී සිටින කාලය පුරාවටම නිසි කාර්යය පටිපාටියට සෑම පුද්ගලයෙකුටම හිමිකම් පවතී; එනම්, අත්අඩංගුවට ගත් අවස්ථාවේ සිට නිසි අධිකරණයක් හෝ විනිශ්චය සභාවක් විසින් අවසන් තීරණයක් ලබා දෙන තෙක් එම අයිතිය හිමි වේ.

2020 මුල් භාගයේදී සාර්ස් කෝ වී -2 (කොවිඩ් -19) වෛරසය ගෝලීයව පැතිරී ගිය අතර එය මෑත ඉතිහාසයේ මාරාන්තිකම වසංගතයට හේතු විය. කොවිඩ් -19 පැතිරීම මැඩපැවැත්වීම සඳහා ශ්‍රී ලංකා රජය ඇතුළු බොහෝ රජයන් දීර්ඝ කාලීන අගුළු දැමීම්, සමාජ දුරස්ථ කරණය මෙන් ම සංචාරක සීමා පැනවීම් අනුගමනය කරන ලදී. කොවිඩ් -19 වෛරසය මෙන්ම ඒ හේතුවෙන් ගෙන එන ලද සෞඛ්‍ය ක්‍රියාමාර්ග හා බැඳුනු අභියෝගවල ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවේ අධිකරණ ක්‍රියාවලිය සැලකිය යුතු බලපෑමකට ලක් විය. ඇතැම් අවස්ථාවන් හී දී ශ්‍රී ලංකාවේ අධිකරණ කටයුතු යථා තත්ත්වයට පත් වුවද, කොවිඩ් -19 වෛරසයෙහි නැවත නැගී ආ රැලි මගින් ශාරීරික සංචලතාව සහ එක්රැස්වීම සීමා කෙරෙන අර්බුද හමුවේ ප්‍රමාණවත් ලෙස ක්‍රියාත්මක වීමට ශ්‍රී ලංකා අධිකරණ පද්ධතියේ ඇති අවදානම අනාවරණය විය. එවැනි අර්බුදයන්ට ප්‍රමාණවත් ලෙස මුහුණ දීමට අවශ්‍ය ක්‍රියාමාර්ග නොමැතිකම, යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට භාජනය වී සිටින පුද්ගලයන්ගේ නිසි කාර්යය පටිපාටියේ අයිතිවාසිකම් සහ අවශ්‍යතා අඩපණ කළ හැකි අතර එය යුක්තිය අවගමනය වීමට ඇති අවදානම ඉහළ නන්වන්නකි.

කොවිඩ් -19 වසංගතය හේතුවෙන් ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතිය මුහුණ දුන් අභියෝග තුලින් නිසි කාර්යය පටිපාටිය සම්බන්ධව ගම්‍යමාන වන කරුණු මෙම වාර්තාව මගින් ගවේෂණය කරයි. ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතියේ නිසි කාර්යය පටිපාටිමය අවශ්‍යතා සපුරාලීම සඳහා අවධානය යොමු කළ යුතු හිඩැස් හඳුනා ගැනීමට එය කටයුතු කරයි. මෙම වාර්තාවට පදනම් වී ඇති පර්යේෂණ, 2020 ඔක්තෝබර් 01 සිට 2021 ජුනි 10 දක්වා කාලය තුළ පොදුවේ ප්‍රවේශ විය හැකි ද්විතීයික තොරතුරු මූලාශ්‍ර වෙතින් සුවිශේෂී අන්දමින් උකහා ගෙන තිබේ. සිය සොයාගැනීම් වලට අදාළ එක් එක් අංශයන් යා කිරීමේ අරමුණින් මෙම පර්යේෂණ කණ්ඩායම ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවලින් පැමිණි නීති වෘත්තිකයන්ගෙන් සහ සිවිල් සමාජ සංවිධාන සාමාජිකයන්ගෙන් ද විමසීම් කරන ලදී.[3]

මෙම වාර්තාව කොටස් හයකින් සන්යුක්ත වේ : (1) ශ්‍රී ලංකාවේ නිසි කාර්යය පටිපාටියේ නෛතික රාමුව සහ විෂය පථය; (2) ශ්‍රී ලංකාවේ කොවිඩ් -19 අත්දැකීම්; (3) COVID-19 හේතුවෙන් ඇති වූ අභියෝගයන්ට අධිකරණමය ප්‍රතිචාරය; (4) COVID-19 සීමාවන් තුලින් ගම්‍යමාන වූ නිසි කාර්යය පටිපාටිමය කරුණු සහ අධිකරණමය ප්‍රතිචාර ගැන විශ්ලේෂණය කිරීම සහ; (5) COVID-19 සීමාවන් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී ඉන්දියාවේ සහ සිංගප්පූරුවේ අධිකරණ අත්දැකීම් සංසන්දනාත්මක විශ්ලේෂණය; මෙන්ම, (6) ශ්‍රී ලංකාවේ නිසි කාර්යය පටිපාටිමය බැඳීම් වැඩිදියුණු කිරීමට උගත් පාඩම් පිලිබඳ විවේචනාත්මක විග්‍රහයක් ඇතුලත් වේ.

# 2
# නීතිය: ශ්‍රී ලංකාවේ නිසි කාර්යය පටිපාටියේ විෂය පථය

ශ්‍රී ලංකාවේ නිසි කාර්යය පටිපාටිය ප්‍රධාන මෙවලම් හතරක් ඔස්සේ සාමූහිකව ප්‍රකාශ වේ. මෙකී මෙවලම් මගින් හඳුනාගෙන ඇති අයිතිවාසිකම්, වරප්‍රසාද සහ විනිර්මුක්තීන් පහත ප්‍රදර්ශිත 1 හි දක්වා ඇත.

ශ්‍රේෂ්ඨාධිකරණය අවස්ථා කිහිපයකදීම ශ්‍රී ලංකාව තුළ පිළිගත් නිසි කාර්යය පටිපාටික අයිතිවාසිකම් සහ මූලධර්ම ක්‍රමානුකූලව අර්ථ නිරූපණය කර ඇත. නිදසුනක් වශයෙන්, නීතිපති v එදිරිව. සෙගු ලෙබ්බේ ලතීෆ් සහ තවත් අයෙක් යන නඩුවේ දී ශ්‍රේෂ්ඨාධිකරණය කියා සිටියේ, සාධාරණ නඩු විභාගයක් සඳහා චූදිතයෙකුට ඇති අයිතිය යන්නට, අනෙකුත් අයිතිවාසිකම් සහ ආරක්ෂණයන් අතර, නීතියෙන් පිහිටුවන ලද සුදුසු, ස්වාධීන සහ අපක්ෂපාතී අධිකරණයක් / විනිශ්චය සභාවක් මගින් සාධාරණ හා ප්‍රසිද්ධ නඩු විභාගයකට මුහුණ දීමට, නීතියෙන් තමාට ඇති අයිතිවාසිකම් සහ හිමිකම් පිළිබඳව දැනුවත් වීමට, සහ අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව නඩු පවරනු ලැබීමට, හිමිකම් ඇති බවයි.[5]

**ප්‍රදර්ශිතය 1:** ශ්‍රී ලංකාවේ විවිධ නීති යටතේ නිසි කාර්යය පටිපාටික අයිතිවාසිකම් සහ ආරක්ෂණ පිළිගෙන ඇති ආකාරය

| | |
|---|---|
| **ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව** | ▪ අත්තනෝමතික සිරභාරයට ගැනීමෙන් නිදහස් වීමේ සහ අත්අඩංගුවට ගැනීමට හේතු දැන ගැනීමේ අයිතිය,[6]<br>▪ නිදහස අහිමි වීමෙන් පසු ආසන්නතම අධිකරණයට ඉදිරිපත් කරනු ලැබීමට ඇති අයිතිය,[7]<br>▪ පෞද්ගලිකව හෝ නීතිඥවරයෙකු මාර්ගයෙන් සාධාරණ නඩු විභාගයකට ඉදිරිපත් වීමට ඇති අයිතිය,[8]<br>▪ අත්තනෝමතික දඬුවම් වලට භාජනය නොවීමට ඇති අයිතිය,[9]<br>▪ වරදකරු බව ඔප්පු වන තුරු නිර්දෝෂී තැනැත්තෙකු ලෙස සලකනු ලැබීමට ඇති අයිතිය,[10]<br>▪ අතීතයට බලපාන දඬුවම්වලට භාජනය නොවීමට ඇති අයිතිය,[11] |

**2007 අංක 56 දරණ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුති පනත**

තමා ඉදිරියේ තම නඩුව විභාග කරවා ගැනීමට ඇති අයිතිය,[11]

- පුද්ගලිකව හෝ නීතිඥවරයෙකු මගින් විත්තිවාචක ඉදිරිපත් කිරීමේ අයිතිය සහ සිය අයිතිවාසිකම් පිළිබඳව දැනුවත් වීමේ අයිතිය,[13]
- සුදුසු අවස්ථාවල දී නීති ආධාර ලබා ගැනීමේ අයිතිය,[14]
- තමා වෙනුවෙන් හෝ තමාට විපක්ෂව සාක්ෂිකරුවන් කැඳවීමට හා ඔවුන්ගේ සාක්ෂි විභාග කිරීමට ඇති අයිතිය,[15]
- පරිවර්තකයෙකු ලබා ගැනීමට ඇති අයිතිය,[16]
- ස්වයං වරද කියා පෑමෙන් නිදහස් වීමේ අයිතිය[17]

**2018 අංක 5 දරන බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වන ජාත්‍යන්තර සම්මුති පනත**

- ඕනෑම පුද්ගලයෙකු රහසිගතව රඳවා තබා ගැනීම වැලැක්වීමට,[18]
- නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලට සහ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසන් සභාවට ඕනෑම රැඳවුම් ස්ථානයකට ප්‍රවේශ වීමට ඉඩ ලබා දීමට.[19]
- නීතිය ක්‍රියාත්මක කරන සියලුම ආයතන නිදහස අහිමි වූවන් සම්බන්ධ නිශ්චිත තොරතුරු සහ දත්ත අඩංගු වාර්තා සහ ලේඛණ පවත්වාගෙන යන බවට සහතික වීමට, [20]
- නිදහස අහිමි කර ඇති පුද්ගලයින්ට නීතියෙන් සපයා ඇති පරිදි සිය ඥාතීන්, නීතිඥ-වරයා හෝ තමා කැමති වෙනත් අයෙකු සමඟ සන්නිවේදනය කිරීමට හා ඔහු ගේ සුව දුක් බැලීමට ඉඩ ලබා දීමට,[21]
- රාජ්‍යය වෙත වගකීම් පවරා තිබේ.

**1979 අංක 15 අපරාධ නඩු විධාන සංග්‍රහ පනත**

- පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීමේදී අදාළ හේතු දැනුම් දිය යුතුය[22]
- අත්අඩංගුවට ගෙන පැය 24 ක් ඇතුළත අත්අඩංගුවට ගත් පුද්ගලයෙකු ළඟම සිටින මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය[23]
- නීතිමය කටයුත්තක් හෝ නඩු විභාගයක් අතරතුර සැකකරුවන්ගේ / වැරදිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම්.[24]

# 3
# සංදර්භය සහ බලපෑම: නැඟීම සහ අගුළු දැමීම

## 3.1 රැළි තුනක් සහ අගුළු දැමීමක්

ජනතාව අතරින් කොවිඩ් -19 රෝගීන් මුලින් අනාවරණය වීමෙන් පසුව 2020 මාර්තු මුල සිට ජුනි දක්වා පළමු රැල්ල ක්‍රියාත්මක විය.[25] කොවිඩ් -19 පැතිරීම මැඩපැවැත්වීම සඳහා 2020 මාර්තු 20 වන දින මුළු දිවයිනටම අගුලු දැමීමේ ස්වභාවයෙන් යුත් ඇඳිරි නීතිය පනවනු ලැබීය.[26] පළමු රැල්ලේ බලපෑම සාපේක්ෂව අඩු වූ අතර ආසන්න වශයෙන් රෝගීන් 2,070 ක් සහ මරණ 11 ක් වාර්තා විය.[27] 2020 මැයි මාසය වන විට, අගුලු දැමීම් ක්‍රමයෙන් ඉවත් කරන ලද අතර, 2020 ජුලි වන විට, යම් සෞඛ්‍ය සීමාවන්ට යටත්ව, එදිනෙදා සාමාන්‍ය කටයුතු නැවත ආරම්භ කිරීමට රජය දිරිමත් කරණ ලදී.[28] එසේ වුවද, පළමු රැල්ල ආසන්න වශයෙන් පුරා මාස තුනක කාලයක් ශ්‍රී ලංකා රජයට සහ පරිපාලන ක්‍රියාවලියට දැඩි බාධා පමුනුවමින් ක්‍රියාත්මක විය.

දෙවන කොවිඩ් -19 රැල්ල 2020 ඔක්තෝබර් සිට 2021 පෙබරවාරි දක්වා ක්‍රියාත්මක විය.[29] පළමු රැල්ලට සාපේක්ෂව දෙවන රැල්ල සැලකිය යුතු ලෙස පුළුල් වූ අතර එමඟින් තවත් රෝගීන් 80000 ක් සහ මරණ 450 ක් වාර්තා විය.[30] දෙවන රැල්ල තුළ 'බන්ධනාගාර පොකුරක්' ද දක්නට ලැබුණු අතර, ශ්‍රී ලංකාවේ විශාලතම රැඳවුම් කඳවුරු අතර වන වැලිකඩ, මහර සහ මීගමුව යන බන්ධනාගාරවල කොවිඩ් -19 රෝගීන් වාර්තා වන්නට විය.[31] නීතිය ක්‍රියාත්මක කරන ආයතන තුළින් ද කොවිඩ් -19 සිදුවීම් අනාවරණය වූ අතර ඇතැම් පොලිස් ස්ථාන කෙටි කාලයක් සඳහා හුදෙකලා කෙරිණි.[32] දෙවන රැල්ල තුළ සමස්ථ දිවයිනම දීර්ඝ කාලීනව අගුලු දමා නොතිබුණද, ඉහළ අනුපාතයකින් කොවිඩ් -19 හඳුනාගත් ප්‍රදේශ කිහිපයක් රජය විසින් අගුලු දැමූ අතර සමස්තයක් ලෙස දෙවන රැල්ල හේතුවෙන් රජයේ සහ පරිපාලනමය කටයුතු මාස කිහිපයක් පුරාවටම බලපෑමට ලක් විය. ශ්‍රී ලංකාවේ ඉහළ අධිකරණ සහ කොළඹ ප්‍රධාන අධිකරණ සංකීර්ණ පිහිටා ඇති අලුත් කඩේ ප්‍රදේශය අධි අවදානම් ප්‍රදේශයක් ලෙස නම් කර 2020 මාර්තු සිට මැයි දක්වා ද 2020 ඔක්තෝබර් සිට 2021 ජනවාරි දක්වා ද අගුළු දැමිණි.[33]

2021 අප්‍රේල් මස මැද වන විට බලධාරීන් ශ්‍රී ලංකාව කොවිඩ් -19 පැතිරීමේ තුන්වන රැල්ලක සිටින බව හඳුනා ගත්හ. මෙම රැල්ල අද වන විට කොවිඩ් -19 රෝගීන්ගේ ඉහළම වැඩිවීමට හේතු වී තිබේ.[34] 2021 අප්‍රේල් 21 සිට ජුනි 10 වන දින දක්වා ශ්‍රී ලංකාව තුළ සමස්ථ රෝගීන් 118,000 ක් සහ මරණ 1,381 ක් වාර්තා විය.[35] කොවිඩ් -19 තෙවන රැල්ල තවදුරටත් අගුළු දැමීම් සහ දැඩි සංචරණ තහනම් සඳහා හේතු වූ අතර නැවත වරක් අමුත්තන් සඳහා බන්ධනාගාර වසා දැමීමට හේතු විය.[36]

## 3.2 නීතිමය කටයුතුවල දී පුද්ගල පෙනීසිටීම් අත්හිටුවීම

ශ්‍රී ලංකාවේ අධිකරණ ක්‍රියාපටිපාටිය හා භාවිතාව පුද්ගලයන් පෙනී සිටිමින් සිදු කෙරෙන නඩු විභාග, භෞතිකව ලිපි ගොනු කිරීම් මෙන්ම ලේඛන හා සාක්ෂි ඉදිරිපත් කිරීම මත දැඩි ලෙස රඳා පවතින්නකි.[37] සාමාන්‍ය ක්‍රියාකාරී අධිකරණ ශාලාවකට විනිසුරුවන්, නීතිඥයින්, අධිකරණ කාර්ය මණ්ඩලය, සාක්ෂිකරුවන්, සැකකරුවන් / රැඳවියන් සහ නීතිය ක්‍රියාත්මක කරන ආයතනවල නිලධාරීන් සහභාගී වන අතර ඔවුන් සියල්ලෝම පැමිණෙනුයේ විවිධ ප්‍රදේශවලිනි. ශ්‍රී ලංකාවේ අධිකරණවල යටිතල පහසුකම් නිතිපතා පුළුල් නොකිරීම නිසා අධිකරණ ශාලා ජනාකීර්ණ වේ.[38] මීට අමතරව, දුරස්ථව ක්‍රියාත්මක වීමට සහ ලේඛන හා සාක්ෂි විද්‍යුත් මාධ්‍යයෙන් ගොනු කිරීම සඳහා ඩිජිටල් සහ ඉලෙක්ට්‍රොනික විසඳුම් ලබා දීමේදී ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතිය මන්දගාමී වී ඇත.[39] 2019 වසර අවසානයේදී අධිකරණවල නඩු 766,000 ක් පමණ විභාග වෙමින් පවතින බව වාර්තා විය.[40]

ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතිය තුල මේ වන විටත් නිදන්ගත අඩුපාඩු කිහිපයක් පවතින අතර එය යුක්තිය පසිඳලීමේ පද්ධතියේ ඵලදායී ක්‍රියාකාරිත්වයට බලපාමින් ඇත. කොවිඩ් -19 සීමාවන් මඟින් අධිකරණ පද්දතියේ ක්‍රියාත්මක දුර්වලතාවන් උග්‍ර කිරීමට උපකාරී විය. කොවිඩ් -19 පැතිරීම සීමා කිරීම සඳහා පනවා තිබූ සීමාවන්ට අනුකූලව, නීතිමය කටයුතු අත්හිටුවීමට හෝ දීර්ඝ කාලයක් තිස්සේ අවම ධාරිතාවයකින් ක්‍රියාත්මක වීමට අධිකරණය කටයුතු කරන ලදී.[41]

# 4
# ප්‍රතිචාරය: ප්‍රමාදය සහ උදාසීන බව

ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතිය ස්ථර දෙකකින් ක්‍රියාත්මක වේ: 1) ඉහළ අධිකරණ සහ 2) මුල් අවස්ථා අධිකරණ. ආණ්ඩුවේ ආයතන ත්‍රිත්වය අතර බලතල බෙදීම පවත්වා ගෙන යාම සඳහා අධිකරණ කළමනාකරණ පද්ධතිය අධිකරණයට පැවරී ඇත. කොවිඩ් -19 තුලින් පැන නැඟුණු අභියෝගයන් හමුවේ යුක්තිය අඛණ්ඩව පරිපාලනය කිරීම සහතික කිරීම සඳහා අධිකරණය විසින් පියවර කිහිපයක් අනුගමනය කරන ලදී. අධිකරණ ස්ථර දෙකම කොවිඩ් -19 සීමාවන්ට ප්‍රතිචාර දැක්වීමට පියවර ගත් අතර ඒවා වෙන වෙනම දක්වා ඇත.

## 4.1 ඉහළ අධිකරණවල ප්‍රතිචාර

පළමු හා දෙවන කොවිඩ් -19 රැලි වලදී අලුත් කඩේ ප්‍රදේශය හුදකලා ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කිරීම හේතුවෙන් ශ්‍රේෂ්ඨාධිකරණ සහ අභියාචනාධිකරණ කටයුතු දීර්ඝ කාලයක් තිස්සේ අත්හිටුවනු ලැබිණි. අනෙක් සියලුම නඩු කටයුතු පිලිසැකසුම් කළ අතර 'හදිසි' සහ 'අත්‍යවශ්‍ය' කරුණු පමණක් විභාග කිරීමට අතුරු පියවර ගැනිණි.[42] 2020 අප්‍රේල් මාසයේ දී, අධිකරණ කටයුතු නැවත ආරම්භ කිරීමෙන් පසුව ගත යුතු පියවර පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දැන්වීම් නිකුත් කරන ලදී.[43] මෙම ක්‍රියාමාර්ග අතරට නඩු කටයුතු එක තැන සිරවී පැවති කාලය පදනම්ව නඩු උපලේඛනගත කිරීම හා කැඳවීම, නඩු සඳහා නිශ්චිත කාල වේලාවන් වෙන් කිරීම සහ අධිකරණයට පැමිණීම නීතීඥයන්ට සහ අධිනීතීඥයන්ට පමණක් සීමා කිරීම ඇතුළත් විය.[44] 2020 මැයි මාසය පමණ වන විට අධිකරණය යලිත් සිය මෙහෙයුම් පුළුල් කල අතර, 2020 ඔක්තෝබර් 12 වන දින ශ්‍රේෂ්ඨාධිකරණය විසින් විමසීමට ගත යුතු නඩු විධිමත් කිරීම සඳහා පූර්ව නඩු විභාගයන් හඳුන්වා දුන් අතර කරුණු කැඳවීම / සඳහන් කිරීම සඳහා විශේෂිත අධිකරණයක් නිර්මාණය කරන ලදී.[45] 2020 ඔක්තෝබර් මැද භාගයේදී, අලුත් කඩේ ප්‍රදේශය අධි අවදානම් කලාපයක් ලෙස ප්‍රකාශයට පත් කර නැවත අගුලු දැමූ අතර, අධිකරණය යලිත් 'හදිසි' සහ 'අත්‍යවශ්‍ය' නඩු කටයුතු පමණක් විභාගයට ගැනිණි.[46] 2021 ජනවාරි මස දී, අලුත් කඩේ ප්‍රදේශයට පනවා තිබූ අගුලු දැමීම් ඉවත් කරන ලද අතර, ශ්‍රේෂ්ඨාධිකරණය සහ අභියාචනාධිකරණය දැඩි සෞඛ්‍ය හා සමාජ දුරස්ථකරණ මාර්ගෝපදේශ යටතේ මෙහෙයුම් නැවත ආරම්භ කරන ලදී. කෙසේ වෙතත්, 2021 මැයි මස මුල වන විට, ශ්‍රේෂ්ඨාධිකරණය සහ අභියාචනාධිකරණය යළිත් සිය කටයුතු තාවකාලිකව අත්හිටුවන ලද්දේ කොවිඩ් -19 හි තුන්වන රැල්ලට අනුව යමිනි.[47]

2021 පෙබරවාරි 15 සහ 2021 මාර්තු 01 යන දෙදින තුල පිළිවෙලින් ශ්‍රේෂ්ඨාධිකරණය සහ අභියාචනාධිකරණය විසින් ජාතික ආරක්ෂාව, මහජන සෞඛ්‍යය, මහජන ආරක්ෂාව හෝ මහජන සාමයට අගතිදායක වන්නා වූ කිසියම් හේතුවක් නිසා සාම්ප්‍රදායික භෞතික නඩු විභාග පැවැත්වීමට අපොහොසත් වන අවස්ථාවන් හී දී අදාළ වන නීති සම්මත කරන ලදී.[48] මහජන සෞඛ්‍යය සම්බන්ධ හදිසි අවස්ථාවන් හී දී නඩු විභාග පැවැත්වීම සඳහා දුරස්ථ තාක්ෂණය භාවිතා කිරීමට ශ්‍රී ලංකාවේ ඉහළම අධිකරණය නිල වශයෙන් අනුමතිය ලබා දුන් පළමු අවස්ථාව මෙය විය.

## 4.2 මුල් අවස්ථා අධිකරණ සහ අධිකරණමය විනිශ්චය සභාවල ප්‍රතිචාර

අනෙකුත් සියලුම අධිකරණ හා විනිශ්චය සභා නියාමනය කිරීම; එනම්, මහාධිකරණ, දිස්ත්‍රික් උසාවි, මහේස්ත්‍රාත් අධිකරණ, ප්‍රාථමික අධිකරණ සහ කම්කරු විනිශ්චය සභා, අධිකරණ සේවා කොමිෂන් සභාවේ විෂය පථයට අයත් වේ.

2020 මාර්තු සිට මැයි දක්වා කාලය තුළ අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කොවිඩ් -19 සීමාවන් සැලකිල්ලට ගනිමින් අධිකරණ කටයුතු ක්‍රියාත්මක විය යුතු ආකාරය පිළිබඳ උපදෙස් සහ මාර්ගෝපදේශ ඇතුළත් චක්‍රලේඛ කිහිපයක් නිකුත් කරන ලදී.[49]

චක්‍රලේඛ කෙටිකාලීන පදනමක් මත මූලිකව නිකුත් කළ අතර වෙනස්වන තත්වයන් සැලකිල්ලට ගනිමින් වරින් වර සංශෝධන සමඟ දීර්ඝ කරන ලදී. මෙම චක්‍රලේඛ මගින් අධිකරණවල නිත්‍ය කටයුතු අත්හිටුවීමටත්, නඩු විභාගය 'හදිසි' නඩු වලට සීමා කිරීමටත්, අගුලු දැමීමේ කාලවලදී ඇප / රිමාන්ඩ් භාරයට ගැනීම්වලට අදාළ අයදුම්පත් සීමා කිරීමටත් අපේක්ෂා කරන ලදී. කොවිඩ් -19 රෝගීන්ගේ වැඩිවීමට ප්‍රතිචාර වශයෙන් 2021 මැයි මස මුල සිට නැවත වරක් මුල් අවස්ථා අධිකරණවල නිතිපතා රැස්වීම් අත්හිටුවීමට සිදු විය.[50]

විශේෂයෙන් ම, ස්කයිප් වැනි වීඩියෝ සම්මන්ත්‍රණ යෙදුම් ඇතුළු අතථ්‍ය විසඳුම් භාවිතා කරමින් අගුලු දැමීම් අතරතුර ඇප / රිමාන්ඩ් අයදුම්පත් විභාගයට ගැනීමට මහේස්ත්‍රාත්වරුන් උනන්දු කරන ලදී.[51] මේ අනුව, 2020 මැයි මසදී පළමු වරට ශ්‍රී ලංකා අධිකරණය විසින් ඇප අයදුම්පත් විභාග කිරීම සඳහා වීඩියෝ සම්මන්ත්‍රණ තාක්ෂණය භාවිතා කරන ලදී.[52] 2020 නොවැම්බරයේදී මහාධිකරණවල විද්‍යුත් ඇප අයදුම්පත් ගොනු කිරීමේ ක්‍රියාවලියක් ද හඳුන්වා දෙන ලදී.[53] මෙම ක්‍රියාපටිපාටිය ඔස්සේ පාර්ශවයන්ට සිය ඇප අයදුම්පත් අතථ්‍ය ලෙස විභාග කරවා ගැනීමේ අභිමතය දෙනු ලැබිණි.

බැඳුම්කරවලට (ඇප රහිතව) ඇතුළු වන ලෙස නියෝග කිරීමෙන් රිමාන්ඩ් භාරයේ සිටින පුද්ගලයින් නිදහස් කිරීමට විනිසුරුවරුන්ට අභිමතානුසාරී බලය පවරනු ලැබිණි.[54] පුද්ගලයන් රිමාන්ඩ් භාරයේ රැඳී සිටීම වැළැක්වීම එවැනි ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීමේ අරමුණ විය. ඇප අයදුම්පත් සහ නඩු විභාග කිරීම පිළිසැකසුම සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් දැඩි කාල රාමුවක් නියම කළ අතර චක්‍රලේඛවල අඩංගු උපදෙස් දැඩි ලෙස පිළිපැදීමට වගබලා ගැනීම විනිසුරුවරුන්ගේ යුතුකම බව යලි යලිත් අවධාරණය කෙරිණි.[55] කොවිඩ් -19 දෙවන හා තෙවන රැලි වලදී ද අධිකරණ සේවා කොමිෂන් සභාව සමාන ක්‍රියාමාර්ග සඳහා උපදෙස් නිකුත් කරන ලදී.

# 5
# ගම්‍යමානවන කරුණු: නිසි කාර්යය පටිපාටියට ඇති බලපෑම්

මෙම කොටසින්, නැවත නැවතත් පනවන ලද කොවිඩ්-19 සීමාවන් සහ අධිකරණමය ප්‍රතිචාරවල ප්‍රතිඵලයක් ලෙස නිසි කාර්යය පටිපාටිමය වශයෙන් ගම්‍යමාන වන කරුණු පිළිබඳ විශ්ලේෂණය කිරීමට උත්සාහ කරයි.

කොවිඩ් -19 සීමාවන් තුළින් දරුනු බලපෑමට ලක් වූ මූලික නිසි කාර්යය පටිපාටිමය අයිතිවාසිකම් දෙකක් හඳුනාගෙන තිබේ, එනම්: (1) සාධාරණ නඩු විභාගයකට ඇති අයිතිය; සහ (2) නෛතික නියෝජනයට සහ නීතිඥ සහාය සඳහා ප්‍රවේශ වීමට ඇති අයිතියයි. කොවිඩ්-19 පැතිරීම සහ අධිකරණමය ප්‍රතිචාර තුලින් උක්ත අයිතිවාසිකම් සම්බන්ධයෙන් ගම්යමානවන කරුණු මෙහි දී වෙන වෙනම විමසා බැලිණි.

විශ්ලේෂණයෙන් හෙළි දරවු වූ පරිදි නිසි කාර්යය පටිපාටිය සම්බන්ධයෙන් කොවිඩ්-19 සීමාවන්හි ඔස්සේ ගම්‍යමාන වූ කරුණු එම සීමාවන්ට ප්‍රතිචාර දැක්වීමේ අඩුපාඩු වලින් පමණක් නොව, පවතින නිදන්ගත ගැටළු උග්‍රවීමෙන් ද ඇති වූ බවයි. එනිසා, නිසි කාර්යය පටිපාටිමය අයිතිවාසිකම් තුලින් ගම්යමානවන කරුණු හා සම්බන්ධ එක් එක් විශ්ලේෂණය කොටස් දෙකකින් ඉදිරිපත් කෙරේ: 1) පූර්ව වසංගත තත්වයන් සහ සීමිත ප්‍රවේශය සඳහා වූ සූදානම; සහ 2) COVID-19 සීමාවන් හා අභියෝගයන්ට මුහුණ දීමේදී අධිකරණයේ ප්‍රතිචාර සහ ඒවායේ කාර්යක්ෂමතාව.

## 5.1 සාධාරණ නඩු විභාගයකට ඇති අයිතිය: ප්‍රමාදයන්ගෙන් බාධා පැමිණීම සහ මාර්ගෝපදේශ මගින් අනාරක්ෂිත වීම

සාධාරණ නඩු විභාගයක් සඳහා ඇති අයිතියට හානි කරන කරුණු තුනක් හඳුනා ගැනිනි: (1) නඩු කල් දැමීම හේතුවෙන් ප්‍රමාදයන් උත්සන්න වීම; (2) අත්‍යාවශ්‍ය නඩු විභාග පැවැත්වීම සඳහා පියවර සහ මාර්ගෝපදේශ නොමැතිකම; සහ (3)'හදිසි' පදනමක් මත විභාග කළ යුතු නඩු අභිමතය පරිදි තීරණය කිරීම.

### 5.1.1 නඩු කල් දැමීමේ දී ප්‍රමාදයන් උත්සන්න වීම

2017 දී නිකුත් වූ විශේෂ කමිටු වාර්තාවකට අනුව, නඩු විභාගය සඳහා දළ වශයෙන් වසර 10 ක් සහ අභියාචනා ක්‍රියාවලිය සඳහා අමතර අවුරුදු 7 ක් වශයෙන් අපරාධ නඩුවක් සම්පූර්ණ කිරීමට සාමාන්‍යයෙන් අවුරුදු 17 ක් ගත වන බව හඳුනා ගැනිණි.[56] ශ්‍රී ලංකාවේ COVID-19 ආරම්භ වීමට පෙර නඩු 776,600 ක් අධිකරණයේ විභාග වෙමින් පැවති අතර, ඉන් 4,620 ක් වසර 20 කට ආසන්න කාලයක් තිස්සේ විභාග වෙමින් පවතී.[57] මෙම දත්ත කරුණු අධිකරණය හරහා නඩු අවසන් කිරීමේ ක්‍රමානුකූල ප්‍රමාදයන් පෙන්නුම් කරයි.

නීතිමය කටයුතු අවසන් කිරීමේ දීර්ඝ ප්‍රමාදයන් සාධාරණ නඩු විභාගයකට ඇති අයිතිය සැලකිය යුතු ලෙස අඩපණ කරන අතර ජයසිංහ එදිරිව. නීතිපති යන නඩුවේ දී එවැනි ප්‍රමාදයන් තුලින් ගම්‍යමාන වන කරුණු පිළිබඳ ගවේෂණය කෙරිණි. එහිදී ප්‍රමාදයන් සැකකරුවකුට සාධාරණ නඩු විභාගයක් සඳහා ඇති අයිතියට අහිතකර ලෙස බලපාන බව ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය විය. (i) පාර්ශවයන්ගේ මතකය ගිලිහීම; (ii) අවශ්‍ය සාක්ෂිකරුවන් හා ලියකියවිලි නොමැතිවීම, (iii) නීතිඥ වියදම්

වැඩි කිරීම සහ (iv) යුක්තිය වෙනුවෙන් සටන් කිරීමට ඇති කැමැත්ත නැතිවීම; ඒ තුලින් සිදුවන්නකි. 'යුක්තිය ප්‍රමාද වීම යනු යුක්තිය ප්‍රතික්ෂේප කිරීම' බව ශ්‍රේෂ්ඨාධිකරණ මතය විය. නඩුවට අදාළ සියල්ල නිවැරදිව නිරීක්ෂණය කල ද, ප්‍රමාදය තුලින් සාදාරන නඩු විභාගයක සාරය ප්‍රතික්ෂේප විය හැකි බව එහි දී සඳහන් කෙරිණි.[58]

කොවිඩ් -19 හමුවේ, දැනටමත් මන්දගාමී අධිකරණ පද්ධතියට සමාජ දුරස්ථකරණ පියවර, සංචරණ සීමාවන් සහ ප්‍රදේශ පුරා පැවති අගුලු දැමීම් සමඟ අතිරේකව සටන් කිරීමට සිදුවිය. ශ්‍රී ලංකාවේ බොහෝ උසාවි 2020 මාර්තු සිට මැයි දක්වාත්, 2020 ඔක්තෝබර් සිට නොවැම්බර් දක්වාත්, නැවත වරක් 2021 මැයි මස මැද සිටත් වසා දමන ලදී.[59] මෙසේ අගුලු දැමූ කාල පරිච්ඡේදය තුළ නඩු කල් දැමීම මෙන්ම පිළිසැකසීම ද සිදු විය. පළමු හා දෙවන රැල්ලෙන් පසු අගුලු දැමීම් ලිහිල් කිරීමෙන් පසුව වුවද, ආසන්න වශයෙන් මාස දෙකක පමණ කාලයක්, සාක්ෂිකරුවන්ට අධිකරණයට යාමට නොහැකි වීම හෝ නීතිඥයින්ට සේවාදායකයින්ගෙන් උපදෙස් ලබා ගැනීමට නොහැකි වීම වැනි විවිධ හේතු නිසා නඩු කිහිපයක් කල් තබන ලදී.[60] මෙම පියවරයන් හේතුවෙන් නඩු විභාග කිරීමේ ප්‍රමාදයන් පිළිබඳ පද්ධතිමය ගැටළුව උග්‍ර විය.

ඇතැම් විනිසුරුවරුන් අධිකරණවල ක්‍රියාකාරිත්වය අඛණ්ඩව පවත්වාගෙන යාම සහ නඩු කටයුතුවලට බාධා නොකිරීම සඳහා ඔවුන්ගේ අභිමතය පරිදි ප්‍රායෝගික පියවර ගෙන තිබුණි. මෙම ක්‍රියාමාර්ග අතරට ජංගම දුරකථන මගින් වීඩියෝ ඇමතුම් ලබා ගැනීමට ඉඩ දීම, අදාළ නඩුව විභාගයට ගැනෙන අවස්ථාවන්ට පමණක් නීතිඥයින්ට සහ සාක්ෂිකරුවන්ට සහභාගී වීමට ඉඩ ලබා දීම මෙන්ම සාක්ෂි කූඩුව නැමෙනසුලු වීදුරු / පොලිතින් කොටස් වලින් ආවරණය කිරීම වැනි යටිතල පහසුකම්වල සුළු වෙනස්කම් සිදු කිරීමෙන් සාක්ෂිකරුවන්ට මුව ආවරණ නොමැතිව සාක්ෂි දීමට ඉඩ ලබා දීම ආදිය සිදු කරන ලදී.[61] කෙසේ වෙතත්, මෙම ප්‍රායෝගික ක්‍රියාමාර්ග විනිසුරුවරුන්ගේ අභිමතය පරිදි අනුගමනය කර ඇති බවක් දක්නට ලැබෙන අතර, ඒ අනුව, ශ්‍රී ලංකාවේ සියලුම අධිකරණවල ඒකාකාරව මෙවන් ක්‍රියාමාර්ග අනුගමනය නොවීය.[62]

ඇතැම් ප්‍රධාන තොරතුරු සපයන්නන් කියා සිටියේ අභියාචනාධිකරණය දුරස්ථ ක්‍රියාමාර්ග ගැනීම තුළින් ඉලෙක්ට්‍රොනිකව ලේඛන ගොනු කිරීමට නීතිඥයින්ට අවසර දී ඇති බවයි.[63] එපමණක් නොව, අතථ්‍ය ක්‍රමවේධ ඔස්සේ අධිකරණයට ඉදිරිපත් කරන ලද සැකකරුවන් සමග සන්නිවේදනය කරමින් අධිකරණ ක්‍රියාවලියේ ප්‍රතිඵල පිළිබඳ ඔවුන්ට සැබෑ අවබෝධයක් පවතින්නේද යන්න විමසා බලන ලෙස විනිසුරුවරුන් අධිකරණ ලේඛකාධිකාරී වරුන්ට නිරන්තරයෙන් උපදෙස් ලබා දී තිබිණි.[64]

එසේ වුවද, එදිනෙදා අධිකරණ කටයුතුවලට ඇති වූ බාධා හේතුවෙන් අධිකරණ කටයුතුවල විශාල ප්‍රමාදයන් සිදුවිය. මහජන සෞඛ්‍ය අර්බුදයන් විසින් ඇති කරන හදිසි අවස්ථා හමුවේ යම් ප්‍රමාදයක් නොවැළැක්විය හැකි වුවද, ක්‍රියාකාරී ප්‍රතිචාර මගින් එවැනි ප්‍රමාදයන් අවම කර ගත හැකිය. පහත දැක්වෙන්නේ නඩු විභාග කිරීමේ ප්‍රමාදයන් අවම කිරීම සඳහා අධිකරණවල ප්‍රගතියට බාධාකාරී වූ අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛවල සහ අධිකරණමය නිවේදනවල හඳුනාගෙන ඇති ප්‍රධාන අඩුපාඩු හයක ලැයිස්තුවකි.

1. 'හදිසි' හෝ 'සුවිශේෂී' නඩු පමණක් විභාග කිරීමට අපේක්ෂා කරන අතර අනෙක් නඩු විනිසුරුවරයාගේ අභිමතය පරිදි නැවත සකස් කළ හැකි වීම.[65]

2. මෙම චක්‍රලේඛ සහ දැන්වීම් වල සාමාන්‍ය අරමුණ වූයේ නඩු විභාග පැවැත්වීම සඳහා ප්‍රායෝගික විසඳුම් ගවේෂණය කිරීමට උසාවි දිරිමත් කිරීම වෙනුවට නිතිපතා අධිකරණ කටයුතු අත්හිටුවීමයි.

3. අධිකරණ කටයුතු ආරක්ෂිතව පවත්වාගෙන යාමට පවතින සම්පත් මත පදනම්ව ප්‍රායෝගික විකල්ප අනුගමනය කිරීම පිළිබඳව වරින් වර අධිකරණයට උපදෙස් දී නොතිබීම.

4. නඩු විභාග කිරීම විධිමත් කිරීම සඳහා ආයතනික හා විධිවිධාන සහ යටිතල පහසුකම් සැලැස්වීම, එනම් නඩු විභාගයන් සහ කැඳවීම් සඳහා වෙනම අධිකරණ ශාලා නම් කිරීම කඩිනම් නො වූ අතර එවැනි ක්‍රියාමාර්ග ගනු ලැබුවේ ද අර්ධ වශයෙන් පමණි.

5. ශ්‍රී ලංකාවේ උපරිමාධිකරණවලට අතථ්‍ය නඩු විභාග සහ විද්‍යුත් ලිපි ගොනු ගොනු කිරීම් සම්බන්ධ කාර්යය පටිපාටීන් සකස් කිරීමට පළමු කොවිඩ් -19 අගුළු දැමීමෙන් වසරක් පමණ ගත විය.

6. මුල් අවස්ථා අධිකරණවල නඩු විභාග අතථ්‍ය ලෙස විභාග කිරීමට හැකිකරවන ක්‍රියා පටිපාටි තවමත් සකස් කර නොමැත.

මෙම තත්වයන්හි ප්‍රතිඵලයක් වශයෙන්, 2019 දී විසඳා අවසන් කරන ලද නඩු හා සසඳන විට 2020 දී විසඳා අවසන් කරන ලද අපරාධ නඩු සංඛ්‍යාව සැලකිය යුතු ලෙස අඩු විය (2019

සහ 2020 අතර අපරාධ නඩු විසඳා ඇති සංඛ්‍යාව සංසන්දනාත්මකව විමසා බැලීම සඳහා ප්‍රදර්ශිතය 2 බලන්න). විසඳා අවසන් කරන නඩු ප්‍රමාණය අඩුවීම තුලින් විසඳා අවසන් කළ නොහැකි වූ නඩු සංඛ්‍යාව ඉහල යාමට දායක වන අතර අනාගතයේ දී නඩු විභාග කර අවසන් වීම තවදුරටත් ප්‍රමාද වීමට හේතු වේ.

**ප්‍රදර්ශිතය 2:** 2019 සහ 2020 අතර විසඳා අවසන් කල අපරාධ නඩු පිලිබඳ සංසන්දනයක්




*2020 දී විභාග කරන ලද නඩු ගණනට 2020 ජනවාරි 1 සිට 2020 නොවැම්බර් 24 දක්වා කාලය තුළ විභාග කළ නඩු පමණක් ඇතුළත් වේ.

මූලාශ්‍ර: නීතිපති දෙපාර්තමේන්තුව, '2019 දී අපරාධ නඩු 16,647 ක් අවසන් කරයි', ඩේලි නිවුස්, 2020 ජනවාරි 1; 'අපරාධ නඩු 9688 සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුව විසින් කටයුතු අවසන් කරනු ලැබේ' නිවුස් ෆස්ට්.එල් කේ 2020 නොවැම්බර් 24.[66]

සංසන්ධනාත්මකව ගත් කල, ශ්‍රී ලංකාවට වඩා කොවිඩ්-19 වෛරසයේ බලපෑමට ලක් වූ විවිධ කලාපවලට අයත් වෙනත් රටවල් අධිකරණ කටයුතු කඩාකප්පල් නොවන බවට සහතික කිරීම සඳහා අතථ්‍ය තාක්ෂණයන් අනුගමනය කිරීමට සාපේක්ෂව කඩිනම් විය. (කොටුව 1 බලන්න: කොවිඩ් -19 මගින් ශ්‍රී ලංකාවට වඩා දරුණු ලෙස පීඩාවට පත් වූ වෙනත් රටවල් වසංගතයේ පළමු මාස හය තුළ දැක්වූ අධිකරණමය ප්‍රතිචාර).

**කොටුව 1: කොවිඩ් -19 මගින් ශ්‍රී ලංකාවට වඩා දරුණු ලෙස පීඩාවට පත් වූ වෙනත් රටවල් වසංගතයේ පළමු මාස හය තුළ දැක්වූ අධිකරණමය ප්‍රතිචාර**

අග්නිදිග ආසියාවේ වැඩිම COVID-19 රෝගීන් **ඉන්දුනීසියාවෙන්** වාර්තා වී ඇත. 2020 අප්‍රේල් මස මැද භාගය වන විට ඉන්දුනීසියානු ශ්‍රේෂ්ඨාධිකරණය වීඩියෝ සම්මන්ත්‍රණ තාක්ෂණය අනුගමනය කරන ලෙස සියලුම පහළ අධිකරණවලට නියම කළේය. මෙයට පෙර පවා, 2020 මාර්තු සිට අප්‍රේල් දක්වා කාලය තුළ අවම වශයෙන් පහළ අධිකරණ 380 ක් අතථ්‍ය නඩු විභාගවලට මාරු වී ඇති අතර අපරාධ නඩු 25,000 ක් පමණ අන්තර්ජාලය හරහා පවත්වා ඇත.[67]

**ඉන්දියාව** 2020 වසර පුරාවටම කොවිඩ්-19 වසංගතයේ දරුනු බලපෑමට ලක් විය. ඊට ප්‍රතිචාරයක් ලෙස 2020 මාර්තු සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ රටේ දිස්ත්‍රික් සහ මහාධිකරණ දුරස්ථ තාක්ෂණය වෙත මාරු වූ අතර නඩු මිලියන 2.6ක් පමණ විභාග කර ඇත.[68] තවද, රටේ තවත් අධිකරණ හරහා අතථ්‍ය නඩු විභාග සඳහා පහසුකම් සැලසීම සඳහා අතිරේක වීඩියෝ සම්මන්ත්‍රණ බලපත්‍ර 1,500 ක් ඉන්දීය රජය විසින් මිලදී ගන්නා ලදී.[69]

**එක්සත් රාජධානිය** කොවිඩ් -19 වසංගතයෙන් වඩාත්ම පීඩාවට පත් රටක් වන අතර ඒ හේතුවෙන් රෝගීන් මිලියන 4.5 කට අධික සංඛ්‍යාවක් සහ මරණ 127,800 ක් වාර්තා වී තිබේ. කෙසේ වෙතත්, 2020 මාර්තු අවසාන සතිය වන විට දුරස්ථ තාක්ෂණය වෙත අධිකරණ මාරු වී ඇති අතර, 2020 අප්‍රේල් මස මැද භාගය වන විට අතථ්‍ය නඩු විභාගය දිනකට 1,000 සිට 3,000 දක්වා ඉහළ ගොස් ඇති අතර එය සමස්ත නඩු අතුරින් 85% ක.[70] අතථ්‍ය අපරාධ නඩු පැවරීම සඳහා 2021 මැයි මාසයේදී ක්‍රවුන් අධිකරණ සහ මහේස්ත්‍රාත් අධිකරණවල විශේෂිත ක්ලවුඩ් වීඩියෝ වේදිකාවක් ස්ථාපිත කරන ලදී. 2020 සැප්තැම්බර් වන විට මෙම වේදිකාව භාවිතා කරමින් 30,000 කට අධික නඩු විභාග විය.[71]

### 5.1.2 දුරස්ථ තාක්ෂණය භාවිතායට අදාල පියවර සහ මාර්ගෝපදේශ නොමැති වීම

කොවිඩ් -19 වසංගතයට පෙර සිට ම ඇප අයදුම්පත් විභාග කිරීමට හෝ සැකකරුවන් දුරස්ථ / අතථ්‍ය මාර්ග මගින් අධිකරණයට ඉදිරිපත් කිරීමට විධිමත් ක්‍රියා පටිපාටියක් හෝ ක්‍රියාවලියක් නොතිබුණි. මේ අනුව, අතථ්‍ය කටයුතු ක්‍රියාවට නැංවීමට අවශ්‍ය ආයතනික විධිවිධාන හා යටිතල පහසුකම් ප්‍රථම වරට සකස් කිරීම අවශ්‍ය විය.

කොවිඩ් -19 ට ප්‍රතිචාර වශයෙන්, 2020 මාර්තු 16 වන දින, ඇප / රක්ෂිත බන්ධනාගාර ගතකිරීම් සම්බන්ධ අයදුම්පත් විමසීමට හා විභාග කර අවසන් කිරීමට දුරස්ථ තාක්ෂණය භාවිතයට අධිකරණ සේවා කොමිෂන් සභාව අවසර දෙනු ලැබීය. 2020 මැයි 20 වන දින ඇප / රක්ෂිත බන්ධනාගාර ගත කිරීම් සම්බන්ධ අයදුම්පතකට අදාල සැකකරුවන් අධිකරණයට ඉදිරිපත් කිරීම සඳහා වීඩියෝ සන්නිවේදන තාක්ෂණය ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට භාවිතා කෙරිනි.[72] පසුව, 2020 ජුනි මසදී 'වීඩියෝ සම්මන්ත්‍රණ පද්ධති' භාවිතා කරමින් කොළඹ බන්ධනාගාර හතරක සිරකරුවන්ගේ ඇප සහ රක්ෂිත බන්ධනාගාර ගත කිරීම් සම්බන්ධ අයදුම්පත් විභාග කිරීමට තාවකාලික අනුමැතිය අමාත්‍ය මණ්ඩලය විසින් ලබා දෙන ලදී.[73] තවද, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන අධිකරණ අමාත්‍යංශය, අධිකරණ සේවා කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව වැනි අනෙකුත් පාර්ශවකරුවන් සමඟ ඇප අයදුම්පත් දුරස්ථව විභාග කිරීම පහසු කිරීම සඳහා බස්නාහිර පළාතේ අධිකරණ සහ බන්ධනාගාර කිහිපයකට උපකරණ ලබා දීමේ ව්‍යාපෘතියක් ආරම්භ කළේය. බන්ධනාගාර රැඳවියන්ට අතථ්‍ය නීති ආධාර සැපයීමට ද එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන සහාය විය. මෙම උත්සාහයන් තුළින් ශ්‍රී ලංකාව 2020 මැයි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ ඇප අයදුම්පත් 10,000 ක් සහ අතථ්‍ය නීති ආධාර සැසි 75 ක් පවත්වන ලදී.[74] 2020 නොවැම්බරයේදී ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම කොළඹ නීති පුස්තකාලය සමඟ එක්ව ශ්‍රී ලංකාවේ වාණිජ මහාධිකරණ සඳහා 'අතථ්‍ය අධිකරණ ශාලාවක් සකස් කිරීමේ වැඩසටහනක් සඳහා පුරෝගාමීත්වය ගන්නා ලදී.[75] මීට අමතරව, 2020 නොවැම්බරයේ හඳුන්වා දුන් ඉලෙක්ට්‍රොනිකව ඇප අයදුම්පත් ගොනු කිරීමේ ක්‍රියා පටිපාටියේ ප්‍රතිඵලයක් ලෙස 2021 ජනවාරි වන විට මෙම ක්‍රමය භාවිතා කරමින් ඇප අයදුම්පත් 70 ක් පමණ ගොනු කර ඇත.[76] බලන්න ප්‍රදර්ශිතය 3: ශ්‍රී ලංකාවේ විකල්පයන් අනුගමනය කිරීමට අදාල කාල රාමුව.

**ප්‍රදර්ශිතය 3:** ශ්‍රී ලංකාවේ විකල්පයන් අනුගමනය කිරීමට අදාල කාල රාමුව



ප්‍රායෝගිකව, එවැනි ඇප අයදුම්පත් එකිනෙකට වෙනස් ස්ථාන දෙකකින් විභාග විය; සැකකරු බන්ධනාගාරයේ සිටිමින් ඊට සහභාගී වූ අතර විනිසුරුවරයා සහ නීතිඥයින් අධිකරණයේ සිට සහභාගී විය. බන්ධනාගාරයේ සහ අධිකරණයේ තබා ඇති ලැප්ටොප් පරිගණකවල ස්කයිප් සබැඳියක් හරහා ඒවා සම්බන්ධ විය.[77] එවැනි තාක්ෂණය භාවිතා කිරීම පහසු විසඳුමක් වුවද, අධිකරණය අනුගමනය කරන ක්‍රමවේදය මඟින් තීරණාත්මක අභියෝග දෙකක් ඉදිරිපත් කරයි. පළමුවෙන්ම, ලැප්ටොප් පරිගණක හරහා සන්නිවේදනය කිරීම සීමිත දෘශ්‍ය පරාසයක් සපයන අතර, සිරකරුවා අපයෝජනයට ලක්ව තිබේද යන්න හෝ බන්ධනාගාර නිලධාරීන්ගේ බලහත්කාරය, පුහුණුකිරීමකට හෝ අනවශ්‍ය බලපෑමකට ලක් කර තිබේද යන්න අර්ථවත් ලෙස තක්සේරු කිරීම අභියෝගයකි.[78] දෙවනුව, ප්‍රධාන තොරතුරු සපයන්නන් විසින් සටහන් කලේ දුරස්ථ නඩු විභාගයේදී සැකකරුවන්ට ඕනෑම අසාධාරණ සැලකීමකට එරෙහිව කථා කිරීම අධෛර්යමත් කෙරෙන තත්වයක් උද්ගත විය හැකි බවයි. විවෘත අධිකරණයේ සාමාන්‍යයෙන් පෙනී සිටින විට මෙන් ඔවුන්ගේ නීතිඥවරයා හෝ ඥාතීන් සමඟ රහසිගතව සන්නිවේදනය කළ නොහැකි වීම මීට හේතුවයි.[79] මීට අමතරව, මහේස්ත්‍රාත්වරුන් සැකකරුගේ තත්වය පිළිබඳව නිරන්තරයෙන් විමසන්නේ නැත. දුරස්ථ නඩු විභාගයේදී සැකකරුවන් කතා කිරීම අධෛර්යමත් කිරීමට මෙය තව දුරටත් දායක වීමක් ලෙස ඉස්මතු කෙරිණි.[80]

පොදුවේ ගත් කල, නීතිමය කටයුතු සඳහා දුරස්ථ තාක්ෂණය භාවිතා කිරීම සම්බන්ධයෙන් අවම වශයෙන් තවත් ආවේනික කරුණු තුනක් ඉස්මතු කර ඇත. පළමුවෙන්ම, අතථ්‍ය සහ වීඩියෝ ක්‍රියාකාරකම් මගින් සේවාධායකයින් සමඟ, (විශේෂයෙන් ඔවුන් අත්අඩංගුවේ සිටින විට) රහසිගතව සන්නිවේදනය කිරීමට නීතිඥයින්ට ප්‍රමාණවත් ඉඩකඩක් ලැබෙන්නේ නැත. දෙවනුව, විද්‍යුත් දත්ත පටිගත කිරීමට හෝ අනුපිටපත් කිරීමට ඇති හැකියාව පෞද්ගලිකත්වය සහ අනන්‍යතාවය සම්බන්ධ වංචා ඇති වීමේ සැලකිය යුතු ගැටළු මතු කරයි. තෙවනුව, නිවෙස් හෝ රැඳවුම් මධ්‍යස්ථාන වැනි දුරස්ථ ස්ථානවලට සිට අතථ්‍ය ලෙස නඩු විභාගවලට සහභාගී වීමේ දී නොදැනුවත්වම විනිසුරුවන්, නීතිඥයින් සහ ජූරි සභිකයින් විසින් සැකකරුවන්ට සහ සාක්ෂිකරුවන්ට එරෙහිව දැඩි අගතිගාමී ලෙස ක්‍රියා කළ හැකිය.[81]

අද වන විට, මෙම අතථ්‍ය නඩු විභාග සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා කිසිදු මාර්ගෝපදේශයක් හෝ යහපත් භාවිතාවන් ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත් කර නොමැත. එවැනි මාර්ගෝපදේශ ප්‍රකාශයට පත් කිරීම තුලින් අරමුණු දෙකක් ඉටු කර ගත හැකිය. පළමුවෙන්ම, සියලු පාර්ශවයන්ට සාධාරණ ලෙස අතථ්‍ය නඩු විභාග පැවැත්වීම සඳහා නඩු පවරන්නන්ට සහ අධිකරණයට එතුළින් මාර්ගෝපදේශ සපයයි. දෙවනුව, අතථ්‍ය නඩු විභාග පිළිබඳ සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි සංවර්ධනය කිරීම සඳහා ආයතනවලට ඒ හරහා සහාය විය හැකි අතර එමඟින් එවැනි නඩු විභාග ක්‍රමානුකූලව සාමාන්‍යකරණය වේ. ශ්‍රී ලංකාවේ අතථ්‍ය නඩු විභාග සම්බන්ධ එවැනි මාර්ගෝපදේශ හෝ යහපත් භාවිතයන් නොමැති වීම ඔස්සේ අතථ්‍ය නඩු විභාග හා සම්බන්ධ නිසි කාර්යය පටිපාටික වටිනාකම් හඳුනා නොගෙන එවැනි නඩු විභාග පැවැත්වීමේ තත්වයක් නිර්මාණය කර ඇත. ඒ අනුව, අතථ්‍ය නඩු විභාගවල ආවේනික ගැටළු විසඳීම සඳහා මාර්ගෝපදේශ හඳුන්වා නොදීමෙන් සිදුවන්නේ සාධාරණ නඩු විභාගයක් සඳහා ඇති අයිතිය අවදානමට ලක්වීමයි. බලන්න 2 වන කොටුව, පොදු නීති සම්ප්‍රදාය අනුගමනය කරන සහ කොවිඩ් -19 වෛරසයේ විවිධ බලපෑම් අත්විඳින විවිධ කලාපවල පාර්ශවකරුවන් සහ රටවල් විසින් අනුගමනය කරන මාර්ගෝපදේශ සහ යහපත් භාවිතයන්.

**කොටුව 2: පොදු නීති සම්ප්‍රදාය අනුගමනය කරන සහ කොවිඩ් -19 වෛරසයේ විවිධ බලපෑම් අත්විඳින විවිධ කලාපවල පාර්ශවකරුවන් සහ රටවල් විසින් අනුගමනය කරන මාර්ගෝපදේශ සහ යහපත් භාවිතයන්.**

2020 අප්‍රේල් මාසයේදී **ඉන්දීය අධිකරණය** වීඩියෝ සම්මන්ත්‍රණ පිළිබඳ නීති සම්මත කළේය.[82] 2020 මැයි සහ ජූනි මාසවලදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් වීඩියෝ / ටෙලි සම්මන්ත්‍රණ මගින් කරුණු විභාග කිරීම පිළිබඳ මාර්ගෝපදේශ ප්‍රකාශයට පත් කරන ලදී.[83] මෙම නීතිරීති හා මාර්ගෝපදේශ දෙකෙහිම අතථ්‍ය අධිකරණ කටයුතු පිළිබඳ සවිස්තරාත්මක ක්‍රියා පටිපාටි අඩංගු වන අතර, සුදානම් වීමේ විධිවිධාන, නඩු කටයුතුවලට සම්බන්ධ වීමට දුරස්ථ ස්ථාන සැකසීම, පුද්ගලයින් පරීක්ෂා කිරීම සහ වීඩියෝ සම්මන්ත්රණවලදී ලේඛන ප්‍රදර්ශනය කිරීම, අතථ්‍ය කාමර / විවේක කාමර පිහිටුවීම වැනි කරුණු ආවරණය කරයි.

'කොවිඩ් -19 සීමාවන් හේතුවෙන් අතථ්‍ය නඩු විභාග වලදී ඇති වන අභියෝගයන්ට නීතිඥයින්ට සහාය වීම' මැයින් **එක්සත් රාජධානියේ පරිපාලන නීතිඥ සංගමය** 2020 මැයි මාසයේදී මාර්ගෝපදේශ මාලාවක් ප්‍රකාශයට පත් කරන

ලදී.[84] මෙම මාර්ගෝපදේශ වල අතථ්‍ය කටයුතු සම්බන්ධයෙන් ලේඛන, තාක්ෂණය සහ නඩු විභාග සඳහා සූදානම් වීමේ හා කටයුතු කිරීමේදී නීතිඥයින් සඳහා වන ක්‍රියා පටිපාටි සහ ඉඟි අඩංගු වේ. 2020 ජූලි මාසයේදී එක්සත් රාජධානියේ අධිකරණ විද්‍යාලය විසින් කොවිඩ් -19 වසංගතය අතරතුර අතථ්‍ය නඩු විභාග කරන විනිසුරුවන් සඳහා මාර්ගෝපදේශ ඇතුළත් 'දුරස්ථ නඩු විභාග පිළිබඳ යහපත් පරිචයන් ප්‍රකාශයට පත් කරන ලදී.[85] මෙම මාර්ගෝපදේශයන් මඟින් නඩු පවරන්නන්ගේ තාක්ෂණික නිපුණතාවල විවිධත්වය, අතථ්‍ය නඩු විභාගයන් හී දී පැන නැගිය හැකි බාධාවන්, තාක්ෂණික ගැටළු සහ කාල පරතරයන් සැලකිල්ලට ගෙන ප්‍රතිචාර දැක්වීමට දිරිමත් කෙරිණි. නඩු විභාගයේ ප්‍රවේශය පැහැදිලි කිරීමට, අතථ්‍ය වේදිකා පාලනය කිරීමේ කුසලතා වර්ධනය කිරීමට සහ නඩු විභාගවලට සහභාගී වන්නන්ගේ හැසිරීම අධිකරණ පරිශ්‍රයක් තුළ අපේක්ෂා කරන දෙයට වඩා වෙනස් විය හැකි බව මතක තබා ගැනීමට විනිසුරුවන් දිරිමත් කරනු ලැබේ.

2020 මැයි මාසයේදී **කැනඩාවේ බ්‍රිටිෂ් කොලොම්බියා සහ ඔන්ටාරියෝ හි නීතිඥ සංගම්** විසින් කොවිඩ් -19 සීමාවන් සැලකිල්ලට ගනිමින් දුරස්ථ නඩු විභාග පිළිබඳ යහපත් භාවිතයන් ප්‍රකාශයට පත් කරන ලදී.[86] මෙම යහපත් භාවිතයන්ට අතථ්‍ය නඩු විභාග සඳහා සූදානම් වීම, තාක්ෂණික ගැටළු සඳහා සැලසුම් කිරීම මෙන්ම ලේඛන සහ සාක්ෂි ඉදිරිපත් කිරීම, ආදිය සඳහා තමන් සහ තම සේවාදායකයින් සූදානම් කිරීමට නීතිඥයින්ට මාර්ගෝපදේශ ඇතුලත් විය. තව ද මෙම යහපත් පරිචයන්ට අතථ්‍ය නඩු විභාග වලදී නීතිඥයින් අනුගමනයකළ යුතු සන්නිවේදන ඉඟි සහ කරුණු කිහි-පයක් ද ඇතුලත් විය.

නිසි කාර්යය පටිපාටිය සම්බන්ධ අන්තර්ජාතික නිරීක්ෂණ සංවිධානයක් වන ෆෙයාර් ට්‍රයල්ස් විසින් 2020 අප්‍රේල් මස දී 'කොරෝනා වයිරස් වසංගතය: දුරස්ථව අපරාධ යුක්තිය පසිඳලීම තුළ සාධාරණ නඩු විභාගයට ඇති අයිතිය ආරක්ෂා කිරීම' යන මැයින් ප්‍රකාශයට පත් කරන ලදී.[87] මෙම ලේඛනය මඟින්, අතථ්‍ය නඩු විභාග හා පොදුවේ සම්බන්ධ කරුණු කිහිපයක් අනාවරණය කරන අතර, ඵලදායී සහභාගීත්වය වැඩි දියුණු කිරීම, අතථ්‍ය ක්‍රම මඟින් නීතීඥවරුන්ට හා තොරතුරුවලට ඇති ප්‍රවේශය වැඩි දියුණු කිරීම, නිදොස් බවේ පූර්ව නිගමනය තහවුරු කිරීම, ඒ අතර විය.

### 5.1.3 'හදිසි' පදනමක් මත විභාග කළ යුතු නඩු වලට ප්‍රමුඛත්වය දීමට ඇති අභිමතය

කොවිඩ් -19 පදනම්ව අධිකරණ සේවා කොමිෂන් සභාව නිකුත් කල චක්‍රලේඛ සහ ශ්‍රේෂ්ඨාධිකරණය නිකුත් කල දැන්වීම් මඟින් නඩු විභාග කිරීම 'හදිසි' හෝ සුවිශේෂී අවස්ථාවන්ට පමණක් සීමා කරන ලදී. නීතිඥවරයා විසින් තම සේවාදායකයා වෙනුවෙන් නඩුවේ හදිසි භාවය සහ අවශ්‍යතාවය නිරූපණය කරමින් අයදුම්පතක් සහ මෝසමක් ඉදිරිපත් කල යුතු වූ අතර, එම නඩුව 'හදිසි' හෝ 'අත්‍යවශ්‍ය' කාරණයක්ද යන්න විනිසුරුවරයා විසින් තීරණය කර යුතු විය.[88] ඉහල අධිකරණවල දී නම්, යම් කාරණයක් සඳහා හදිසි අතථ්‍ය නඩු විභාගයක් අවශ්‍ය අයදුම්පතක් ඉදිරිපත් වූ විට, එය අත්‍යාවශ්‍ය දැයි තීරණය කිරීම නම් කරන ලද විනිසුරුවරයෙකු විසින් තීරණය කළ යුතු විය.[89]

ඒ අනුව, අගුළු දැමූ කාලය තුළ විභාගයට ගත් නඩු පවා විභාගයටගත යුතු බවට පුරෝකථනය කෙරුනේ යම් තරමක 'හදිසියක්' හෝ සුවිශේෂී තත්වයක් ඇති බව තහවුරු වූ පසුව පමණි.

කොවිඩ් -19 හේතුවෙන් අධිකරණයේ ධාරිතාව සීමා කර මාස කිහිපයක් ගතවී ඇතත්, 2021 ජුනි 10 දින වන විට, නඩුවක් 'හදිස' හෝ 'සුවිශේෂී' ද යන්න තීරණය කිරීමේදී විනිසුරුවරුන් විසින් සලකා බැලිය යුතු කරුණු මොනවාද යන්න පැහැදිලි නොවීය. 'හදිසි' හෝ සුවිශේෂී කාරණා සම්බන්ධ වන්නේ කුමන නඩු වලටද යන්න ගැන ප්‍රමාණවත් මඟ පෙන්වීමක් නොමැති තත්වයක් තුල ඒ බව තීරණය කිරීමේදී විනිසුරුවන්ට පූර්ණ අභිමතය ඇති බව පෙනේ.[90] එහෙයින්, හදිසි අධිකරණ මැදිහත්වීමක් අවශ්‍ය වන කරුණු, එනම් නිදහස අහිමි වීම හෝ අවදානමට ලක්විය හැකි පුද්ගලයන්ගේ අවශ්‍යතා වැනි නඩු ප්‍රමුඛතා කාරණයක් ලෙස විභාග කරනු ඇති බවට සහතික කෙරෙන කිසිදු ආරක්ෂණයක් නොපවතී. මේ සම්බන්ධයෙන් පවතින මාර්ගෝපදේශ සහ නීති විද්‍යාවේ සංවර්ධනය කැටි කොට ගැනීම තුලින් 'හදිසි' හෝ සුවිශේෂී තත්වයකට අන්තර්ගත වනුයේ කුමන කරුණු ද යන්න තීරණයකළ හැකි අතර, අගුලු දැමීමකදී පවා විභාග කළ යුතු ස්වභාවයන්ගේ නඩුවලට ප්‍රමුඛතාවය දීම සඳහා ස්ථාවර හා සාධාරණ ප්‍රවේශයක් අනුගමනය කිරීමට විනිසුරුවන්ට සහාය විය හැකිය. කොවිඩ්-19 වසංගතය තුළ 'හදිසි' අවස්ථාවන්ට ප්‍රමුඛතාවය දීම සඳහා ජාත්‍යන්තර ආයතන සහ සංවිධාන විසින් නිර්දේශ කරන යහපත් භාවිතයන් 3 වන කොටුව මඟින් පෙන්නුම් කරයි.

**3 වන කොටුව: 'හදිසි' අවස්ථාවන්ට ප්‍රමුඛතාවය දීම සඳහා ජාත්‍යන්තර ආයතන සහ සංවිධාන විසින් නිර්දේශ කරන යහපත් භාවිතයන්**

2020 මැයි මස දී **ජාත්‍යන්තර නීතිවේදීන්ගේ කොමිසම** (ICJ) විසින් 'උසාවි අධිකරණය සහ කොවිඩ් -19' නමින් සංක්ෂිප්තයක් ප්‍රකාශයට පත් කරන ලදී. මෙම සංක්ෂිප්තයේ, 'හදිසි' නඩුවක් යනු කුමක්ද යන්න පිළිබඳ පොදු එකඟතාවයක් නොමැති බව පිළිගත් නමුත්, නඩුවක් හදිසිද නැද්ද යන්න තීරණය කිරීමේදී විශේෂයෙන් සලකා බැලිය යුතු වටිනා සාධක පහත පරිදි ලැයිස්තුගත කර තිබේ:

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය අයිතිවාසිකම් හෝ මානව හිමිකම් උල්ලංඝනයක් පවතීද, විශේෂයෙන් පිළියම් කළ නොහැකි හානියක් සිදු වීමට ඉඩ තිබේ ද?
- ළමයින්, කාන්තාවන් සහ ආබාධ සහිත පුද්ගලයින් වැනි අවදානමට ලක්විය හැකි පුද්ගලයින්ට අදාළ කාරණය හානියක් විය හැකිද?
- අදාළ නඩුව ගෘහස්ථ හිංසනය, අපයෝජනය හෝ නොසලකා හැරීම සම්බන්ධ වූවක් ද?
- එම නඩුව පුද්ගල නිදහස අහිමි වීමක් සම්බන්ධ ද?

'හදිසි' අවස්ථාවන්ට ප්‍රමුඛතාවය ලබා දීමේ ගැටලුව ගවේෂණය කිරීමේදී ආරක්ෂාව සහ සහයෝගීතාව සඳහා වූ යුරෝපා සංවිධානය ද යම් මග පෙන්වීමක් ලබා දී ඇත. 'නීති, රෙගුලාසි හෝ නිර්දේශ ස්වරූපයෙන් හදිසිතාව තීරණය කිරීම ගැන සාමාන්‍ය මග පෙන්වීමක් තුළින් නඩුවෙන් නඩුවට සමබරව න්‍යායශීලී භාවයෙන් ක්‍රියාත්මක විය හැකි අතර, අත්තනෝමතික බාවය වළක්වා ගැනීමට සහ සාධාරණත්වය, විනිවිදභාවය සහ අනුකූලතාව සහතික කිරීමට ප්‍රයෝජනවත් වේ. මේ අනුව, නඩු සඳහා ප්‍රමුඛතාවය ලබා දීමේදී නීතිමය මාර්ගෝපදේශ සහ අධිකරණ අභිමතය යන ද්විත්වයම සැලකිල්ලට ගත යුතු බව නිර්දේශ කර තිබේ.[91]

## 5.2 නෛතික නියෝජනය සහ නීතිමය සහාය සඳහා ප්‍රවේශය

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව 2018 දී පුළුල් බන්ධනාගාර අධ්‍යයනයක්[92] සිදු කළ අතර එහිදී නිරීක්ෂණය වූයේ 'ඵලදායී හා ප්‍රවේශ විය හැකි නීති ආධාර යාන්ත්‍රණයක්' සහ සන්නිවේදන ක්‍රමවේදයන් නොමැති වීම සිරකරුවන්ට නීති උපදේශන සහ නීති ආධාර ලබා ගැනීමට බරපතල අභියෝග නිර්මාණය කර ඇති බවයි.[93] අධ්‍යයනය සඳහා සලකා බැලූ ආයතන 20 අතුරින් සිරකරුවන්ට දුරකථන මාර්ගයෙන් සන්නිවේදන සේවා සපයා තිබුනේ එක් බන්ධනාගාරයක් පමණි.[94] මෙහි දී සාමාන්‍ය පරිඡය වන්නේ නීතිඥයින් බන්ධනාගාරයේ සිටින සැකකරුවන් බැලීමට ගොස් ඔවුන් වෙතින් පෞද්ගලිකව උපදෙස් ලබා ගැනීමයි.[95] 2021 මැයි මස දී ශ්‍රී ලංකා නීතිඥ සංගමය පොලිස්පතිවරයා සහ අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවේ සහ ත්‍රස්ත විමර්ශන දෙපාර්තමේන්තුවේ ප්‍රධානීන් වෙත ලිපියක් යවමින්, නීතිඥයින් සහ රැඳවුම් භාරයේ සිටින සේවාධායකයින් අතර රහස්‍ය සන්නිවේදනයන් පැවැත්වීමේ අයිතිය උල්ලංඝනය කිරීම පිළිබඳව කනස්සල්ල පළ කරන ලදී. නීති ආධාර ලබා ගැනීමේ අයිතිය උල්ලංඝනය කරමින් පොලිස් නිලධාරීන් විසින් අනුගමනය කරන ලද සමහර නීති විරෝධී ක්‍රියා පටිපාටීන් මෙම ලිපියෙන් අවධාරණය කෙරිණි. නීතිඥයින් සහ සේවාදායකයින් අතර සන්නිවේදන පටිගත කිරීම, උපදේශනය හරස්වන ලෙස හෝ උපදේශනය අධීක්ෂණය කිරීම සඳහා සමීප දුරකින් වාඩි වී සිටීම මෙයට ඇතුළත් ය.[96]

නෛතික නියෝජනයක් නොමැතිව සිරකරුවන් උසාවියට ඉදිරිපත් කරන විට සිදුවන නිසි කාර්යය පටිපාටික අයිතිවාසිකම් උල්ලංඝනයන් මානව හිමිකම් කොමිෂන් සභා වාර්තාව මගින් අවධාරණය කරයි. නිදසුනක් වශයෙන්, නඩු විභාගයට පෙර අධිකරණයට ඉදිරිපත් කළ රැඳවියන් සමඟ මහේස්ත්‍රාත්වරුන් සන්නිවේදනය නොකළ බවත් දිගටම රිමාන්ඩ් භාරයේ තැබීමට හේතු ඔවුන් වෙත ඉදිරිපත් නොකළ බවත් වාර්තා විය.[97] මීට අමතරව, රක්සිත බන්ධනාගාර ගත වූවන් කියා සිටියේ අධිකරණ කටයුතු තමන්ට තේරෙන භාෂාවකින් සිදු නොකළ බවයි.[98] මේ අනුව, කොවිඩ් -19 වසංගතයට පෙරාතුව පවා ශ්‍රී ලංකාවේ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට මුහුණ දුන් පුද්ගලයින් හට නීති ආධාර සඳහා ප්‍රමාණවත් ප්‍රවේශ පහසුකම් නොවීම බරපතල ගැටළුවක් විය.

මහජන සෞඛ්‍ය අර්බුදවලදී බන්ධනාගාර දැඩි අවදානමක් සහිත ආයතන වන අතර, කොවිඩ් -19 අගුලු දැමීම්වලදී සහ ඉන් පසුව පවා බන්ධනාගාරවලට ප්‍රවේශ වීම සම්පූර්ණයෙන්ම

තහනම් විය.[99] බන්ධනාගාරවල බහුතරයක සිරකරුවන් සමඟ දුරකථන / භෞතික නොවන සන්නිවේදනයක් සිදු නොවීම හේතුවෙන්, බන්ධනාගාරයේ සිටින තම සේවාදායකයින් සමඟ සන්නිවේදනය කිරීමේදී නීතිඥයින් අභියෝග කිහිපයකට මුහුණ දුන්හ. විශේෂ අවස්ථාවන් හී දී සන්නිවේදනය කිරීමට අවශ්‍ය වූ විට නීති ආධාර සඳහා ප්‍රවේශය නොමැතිකම විශේෂයෙන් ගැටළු සහගත විය.[100] නිදසුනක් වශයෙන්, රඳවාගෙන සිටින සේවාදායකයින්ගෙන් දැනට සිදුකෙරෙන විමර්ශන පිලිබඳ තොරතුරු ලබා ගැනීමේදී සහ බෝ නොවන රෝග ඇති බවට සැක කරන අයට බන්ධනාගාරවල වෛද්‍ය ප්‍රතිකාර ලැබේද යන්න තහවුරු කර ගැනීමේදී අභියෝග ඇති බව සටහන් විය.[101] බොහෝ අවස්ථාවලදී රඳවාගෙන සිටින සේවාදායකයින්ගේ පවුලේ සාමාජිකයන් වෙතින් තොරතුරු ලබා ගැනීමට නීතිඥයින්ට හැකියාව ලැබුන ද, රඳවාගෙන සිටින ඇතැම් සේවාදායකයින්ගෙන් ඔවුන්ගේ නඩු සම්බන්ධ උපදෙස් ලබා ගැනීම නීතිඥයින්ට අවහිර කළ අවස්ථා තිබිණි.[102] මෙමඟින් නඩුවිභාග කිරීමේ ප්‍රගතියට බාධා වන අතර ප්‍රමාදයන් සහ ගොඩගැසීම් සඳහා හේතු වේ.

ඇතැම් විනිසුරුවරුන් නීතිඥයින් හා රැඳවියන් අතර සන්නිවේදනය පහසු කිරීම සඳහා ප්‍රායෝගික විසඳුම් අනුග මනය කළහ. මෙම විසඳුම් අතර සංචරණ තහනම් කර ඇති සහ සිරකරුවන් බැලීම සීමා කර ඇති අවස්ථාවන් හී එකඟ වූ වේලාවක දුරකථනයක් භාවිතා කරමින් රැඳවියාට නීතිඥ වරයා සම්බන්ධ කර ගැනීමට ඉඩ දෙන ලෙස බන්ධනාගාර නිලධාරීන්ගෙන් ඉල්ලා සිටීම ඇතුලත් වූ අතර එය නඩු වාර්තාවේ සටහන් කෙරිණි.[103] කෙසේ වෙතත්, එවැනි ක්‍රියාමාර්ග විනිසුරුවරයාගේ අභිමතය පරිදි ක්‍රියාත්මක කරන ලද අතර, ශ්‍රී ලංකාව පුරා අධිකරණවලදී ඒකාකාරව ක්‍රියාත්මක නොවීය.[104]

නෛතික නියෝජනය සහ නීති ආධාර නොමැතිකම හේතුවෙන් නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ට මුහුණ දෙන අවස්ථාවේ රැඳවියන්ට ඔවුන්ගේ නීත්‍යානුකූල අයිතිවාසිකම් සහ හිමිකම් පිළිබඳව අවබෝධයක් නොමැති විය හැකිය. එවැනි තත්වයන් නීතියට මුහුන දී සිටින පුද්ගලයින්ට බරපතල ලෙස අගතිගාමී විය හැකිය.

# 6
# සංසන්දනාත්මක විශ්ලේෂණය: කොවිඩ්-19 තුළ නිසි කාර්යය පටිපාටිය උල්ලංඝනයන් අවම කිරීම සඳහා ඉන්දියාවේ සහ සිංගප්පූරුවේ අනුගමනය කරන ලද පියවර

කොවිඩ් -19 වසංගතයෙන් පැන නගින නීතිමය ප්‍රතිවිපාක සම්බන්ධයෙන් ඉන්දියානු සහ සිංගප්පූරු ප්‍රතිචාර මෙම කොටසේ සාකච්ඡා කෙරේ. මෙම රටවල් දෙක සංසන්දනාත්මක විශ්ලේෂණය සඳහා තෝරා ගනු ලැබුවේ එම රටවල් ආසියානු කලාපයට අයත් වන අතර ම ඉංග්‍රීසි පොදු නීති සම්ප්‍රදායන්අනුග මණය කිරීම යන කරුණු මත පදනම් වෙමිණි. ශ්‍රී ලංකාව පිළිබඳ විශ්ලේෂණයට සමානව, ඉන්දියාවේ සහ සිංගප්පූරුවේ පූර්ව වසංගත තත්වයන් සහ කොවිඩ් -19 වෛරසය තුලින් ඉදිරිපත් වූ අභියෝගයන්ට එම රටවල් දක්වන ප්‍රතිචාරය අනුව මෙම සංසන්දනාත්මක විශ්ලේෂණය සිදු කෙරේ.

## 6.1 ඉන්දියාව

### 6.1.1 පූර්ව COVID-19 රාමුව

ශ්‍රී ලංකාවේ මෙන්ම, ඉන්දියාවේ ද නිසි කාර්යය පටිපාටියේ විෂය පථය ඉන්දීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා අපරාධ නඩු විධාන සංග්‍රහය තුළ අන්තර්ගත වේ. මෙම උපකරණ සාම්ප්‍රදායිකව නිසි කාර්යය පටිපාටිය හා සම්බන්ධ අයිතිවාසිකම්, වරප්‍රසාද සහ විනිර්මුක්තීන් හඳුනා ගනී. ඉන්දියාව ද පුද්ගලයන් පෙනීසිටිමින් නීතිමය කටයුතු සිදු කිරීම මත දැඩි ලෙස රඳා පැවති රටකි. නමුත් 2007 සිට අධිකරණය විසින් නඩු විසඳීම විධිමත් කිරීම සඳහා නීති තාක්ෂණය උපයෝගී කර ගැනීම ක්‍රමිකව ආරම්භ කරන ලදී.[105]

නඩු විභාගවලදී විද්‍යුත් හා තාක්ෂණික විසඳුම් අනුගමනය කිරීම සඳහා ඉන්දියාවේ ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණ දෙකක් වැදගත් විය.[106] පළමුව, ඉන්දීය තරුණ නීතිඥ සංගමය එදිරිව. ඉන්දීය ජනරජය නඩුවේදී, ඉන්දීය ශ්‍රේෂ්ඨාධිකරණය පොලිස් විමර්ශනවල මුල් තොරතුරු වාර්තා[107] සියලුම ප්‍රාන්ත පොලිස් නිල වෙබ් අඩවියට හැකි ඉක්මනින් උඩුගත කරන ලෙස මධ්‍යම හා ප්‍රාන්ත රජයන්ට උපදෙස් දෙනු ලැබීය.[108] පොලිසිය මුල් තොරතුරු ලියාපදිංචි කළ දින සිට පැය 24 ක් ඇතුළත මෙය සිදු කරන ලෙස බලධාරීන්ගෙන් ඉල්ලා සිටිනු ලැබිණි.[109] මෙම නඩුවේදී, මුල් තොරතුරු වාර්තාවේ පිටපතක් මුල් අවස්ථාවේදීම ලබා ගැනීමට විත්තිකරුට ඇති අයිතිය අධිකරණය පිළිග න්නා ලදී.[110]

දෙවනුව, ඉන්දියාව අධිකරණ නඩු පරිපාලනය කිරීමේදී සහ අවසන් කිරීමේදී විද්‍යුත් විසඳුම් ක්‍රියාත්මක කිරීම සඳහා මූලික වේදිකාවක් සපයන 'ඊ-කෝට් ඉන්ටිග්රේෂන් මිෂන් මෝඩ් ප්‍රොජෙක්ට්' යන ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතියේ පරමාර්ථය වූයේ සමස්ත අධිකරණ පද්ධතියම පරිගණක ගත කිරීම තුළින් නඩු පවරන්නන්, නීතිඥයින් සහ අධිකරණය වෙත නම් කරන ලද සේවාවන් සැපයීමයි.[111] 2007 දී මෙම ව්‍යාපෘතියේ පළමු අදියර ආර්ථික කටයුතු පිළිබඳ කැබිනට් කමිටුව විසින් අනුමත කරන ලද අතර වසර දෙකක

කාලයක් තුළ දිස්ත්‍රික් හා දෙවන පෙළ අධිකරණ 13,348 ක් ඩිජිටල්කරණය කිරීම අරමුණු කෙරිණි.[112] 2015 මාර්තු 31 වන විට ඉන්දීය අධිකරණ අමාත්‍යාංශය වාර්තා කළේ දෘඩාංග හා මෘදුකාංග ස්ථාපනය කිරීම, සම්බන්ධතාවය ලබා දීම, කළමනාකරණ ප්‍රතිසංස්කරණ සම්බන්ධ ක්‍රියාකාරකම් වලින් 95% ක් පමණ අවසන් කර ඇති බවයි.[113] මෙම ව්‍යාපෘතියේ දෙවන අදියර 2015 දී ආරම්භ කරන ලද්දේ වසර හතරක කාලයක් තුළ නඩු පවරන්නන් සඳහා විවිධ සේවාවන් 30 ක් සැපයීමේ අරමුණෙනි.[114]

අධිකරණය විසින් 2013 අගෝස්තු 7 වන දින ජාතික ඊ-අධිකරන ද්වාරය[115] සහ ජාතික අධිකරණ දත්ත ජාලකය පිහිටවූ අතර ඒවා අධිකරණ දත්ත සත්කාරක සේවාවන් විය.[116] මෙම සේවාවන් හරහා, නඩු පවරන්නන්ට සහ පාර්ශවකරුවන්ට නඩු ලියාපදිංචිය, නඩු ලැයිස්තුව, නඩුවෙහි වර්තමාන තත්ත්වය, දෛනික නියෝග සහ අවසාන විනිශ්චයන් පිළිබඳ දත්ත ලබා ගත හැකිය. දැනට, මෙම සේවාවන් මගින් මහජනතාවට මිලියන 70 කට අධික විභාග වෙමින් පවතින සහ විභාග කර අවසන් වූ නඩු මෙන් ම දිස්ත්‍රික් හා දෙවන පෙළ අධිකරණවල මිලියන 30 කට අධික නියෝග සහ නඩු තීන්දු පිළිබඳ තොරතුරු ලබා ගත හැකිය.

### 6.1.2 කොවිඩ් -19 සඳහා වූ නිශ්චිත ප්‍රතිචාර

2020 මාර්තු 21 වන දින ඉන්දීය අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි විසින් රට පුරා දින 21 ක අගුලු දැමීමක් ප්‍රකාශයට පත් කරන ලදී. ඊට සමගාමීව, 2020 මාර්තු 26 වන දින ඉන්දීය ශ්‍රේෂ්ඨාධිකරණය නියෝගයක් නිකුත් කරමින් කියා සිටියේ, සියලුම ඉහළ හා පහළ අධිකරණවල හදිසි නඩු පමණක් විභාග කළ යුතු බවයි.[117] කෙසේ වෙතත්, 2020 මැයි 18 වන දින ශ්‍රේෂ්ඨාධිකරණය සිය ගිම්හාන නිවාඩුව කල් දැමීමට තීරණය කළ අතර අලුතින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ යටතේ අත්‍යාවශ්‍ය නඩු විභාග පැවැත්වීමට තීරණය කෙරිණි.[118] මෙම මාර්ගෝපදේශයන්ට අනුව, අදාළ අධිකරණය විභාගයට ගැනීමට නියමිත නඩු ලැයිස්තු කල්තියාම ප්‍රකාශයට පත් කළ යුතු අතර, පාර්ශවකරුවන් තමා සතු මෙවලම් හරහා අත්‍යාවශ්‍ය නඩු විභාගවලට සම්බන්ධ වන්නේ ද, නොඑසේ නම් වසංගතයට පෙර සිට ම ශ්‍රේෂ්ඨාධිකරණ පරිශ්‍රයේ ස්ථාපනය කර ඇති ඩිජිටල් පහසුකම් හරහා ඒ සඳහා සම්බන්ධ වන්නේ ද යන්න ප්‍රකාශ කළ යුතුය.[119] ඊට අමතරව, ඉන්දීය ශ්‍රේෂ්ඨාධිකරණය එහි ක්‍රියාත්මක වන විනිශ්චය මණ්ඩල 17 ම කඩදාසි වලින් තොර කිරීම සහ අධිකරණ කටයුතු විධිමත් කිරීම සඳහා කෘතිම බුද්ධි මෙවලම් ඇතුළත් ‘SCI-Interactive’ මෘදුකාංගය සංවර්ධනය කරන ලදී.[120] මෙම මෘදුකාංගයේ තාක්ෂණික සංරචක නඩු තීන්දු ලබා දීම වේගවත් කිරීමට සහ කඩිනම් තීරණ ගැනීමට ඉවහල් වන ලෙස නිර්මාණය කර ඇත.

පහළ උසාවි දැනටමත් යම් මට්ටමකට ඩිජිටල්කරණය කර ඇති හෙයින්, අගුලු දැමීම ඉවත් කිරීමෙන් පසු පළමු මාස හතර තුළ මෙම අධිකරණවලට අත්‍යාවශ්‍ය නඩු විභාග මිලියන 2.6 ක් පැවැත්වීමට හැකි විය.[121]

## 6.2 සිංගප්පූරුව

### 6.2.1 පූර්ව ව්‍යවස්ථාදායක හා ප්‍රතිපත්තිමය තීරණ

සිංගප්පූරුව තුල නිසි කාර්යය පටිපාටික අයිතිවාසිකම් ප්‍රධාන නීති දේහයන් තුනක් යටතේ පිළිගනු ලැබේ: (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව; (2) අපරාධ නඩු විධාන සංග්‍රහය; සහ (3) සිංගප්පූරු පොලිස් බලකා පනත ඒවා ය. මෙහි ඇති වඩාත්ම වැදගත් දෙය නම්, 2010 දී සිදු කළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් මගින් වීඩියෝ සම්මන්ත්‍රණ හෝ ඒ හා සමාන තාක්ෂණයකින් රැඳවියන් නිසි අධිකරණයකට ඉදිරිපත් කිරීමට පොලිසියට හෝ වෙනත් අදාළ බලධාරීන්ට ඉඩ ලබා දීමයි.[122] මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පසුව, සමාජයේ විකාශනය වන අවශ්‍යතා සපුරාලීමට අධිකරණ පද්ධතියේ කාර්යක්ෂමතාව සහ ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා ක්‍රියාදාම ගණනාවක් සිංගප්පූරුව හඳුන්වා දෙන ලදී. 2019 වන විට සිංගප්පූරුව විසින් අධිකරණ ලේඛන අත්‍යාවශ්‍ය ලෙස පරීක්ෂා කිරීමට සහ ලබා ගැනීමට, මහාධිකරණ නඩු විභාගවල (විවෘත අධිකරණ නඩු වලදී) ශ්‍රව්‍ය පටිගත කිරීම් ලබා ගැනීමට සහ අපරාධ නඩු විභාග සඳහා දුරස්ථ අර්ථ නිරූපණ සේවා ලබා ගැනීමට හැකි ඊ-ක්‍රියාවලීන් දැනටමත් ස්ථාපනය කර ඇත.[123] එහි ප්‍රතිඵලයක් ලෙස කාර්යක්ෂමතාව සහ විනිවිදභාවය තුලින් සිංගප්පූරු අධිකරණයන් හී කීර්තිනාමය ඉහල ගොස් ඇති අතර ක්ෂණික සහනයන් සහතික කරන සංසදයක් බවට පිළිගැනීමට ලක්ව ඇත.[124] 2019 වසරේ දී නව සිවිල් හා අපරාධ නඩු 15,702 ක් ශ්‍රේෂ්ඨාධිකරණයට ගොනු කර ඇති අතර, ඒ අතුරින් 15,041 ක් එම වසර තුළම අවසන් විය.[125]

### 6.2.2 කොවිඩ්-19 වසංගතය හමුවේ අධිකරණමය ප්‍රතිචාරය

